ඒකාබද්ධ සේවා චක්‍රලේඛ: 02 / 2013

මගේ අංකය: PA/CS/6/4/කා. කඩඉම් විභාග,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2013.09.23

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 111 පන්තියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 111 පන්තියට 2007.12.10 දිනැතිව හා 2008.09.01 දිනැතිව පත්වීම් ලද නිලධාරීන්ට 111 පන්තියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත පරිදි නොපැවැත්වීම මත එම කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා පත්වීම් දින සිට පවත්වන ලද අනුගාමී විභාග වාර 04 ක් දක්වා සහන කාලයක් පහත පරිදි ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

| විභාග අවස්ථාව | පත්වීම් දිනය | සහනය ලබාදීමට සලකා බලනු ලබන විභාග පැවැත්වූ දිනයන් | පත්වීම් දිනය | සහනය ලබාදීමට සලකා බලනු ලබන විභාග පැවැත්වූ දිනයන් |
|---|---|---|---|---|
| 1 | 2007.12.10 | 2008.08.30 | 2008.09.01 | 2009.07.26 |
| 2 | | 2009.07.26 | | 2010.07.17 |
| 3 | | 2010.07.17 | | 2011.10.01 |
| 4 | | 2011.10.01 | | 2013.01.27 |

02. මේ අනුව උක්ත දිනයන්හි පත්වීම් ලත් නිලධාරීන් අදාල විභාග වාර 04 ඇතුලත කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන්නේ නම් වැටුප් වර්ධක විලම්භනය නොවන අතර සෙසු නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන දිනය දක්වා පරිවාස කාලය දීර්ඝ වේ.

03. ඉහත 02 හි පරිදි කාර්යක්ෂමතා කඩඉම සමත්ව මේ වන විට වැටුප් වර්ධක විලම්භනය කරන ලද නිලධාරීන්ගේ පරිවාස කාලය සංශෝධනය කිරීම සඳහා ආයතන ප්‍රධානියා මඟින් ඉල්ලීම් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

කේ.වී.පී.එම්.ජේ.ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් .

ඒකාබද්ධ සේවා චක්‍රලේඛ: 03 /2009

මගේ අංකය: පීඒ/සීඑස්/6/4/කා.ක.විභාග,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2009 සැප්තැම්බර් මස 03 වැනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ</u>**

**<u>නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය.</u>**

2004.01.01 දින සිට 2006.12.31 දින දක්වා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට පත්වීම් ලැබූ නිලධාරීන්ට ව්‍යවස්ථාවේ 5:1 වගන්තියෙන් නියම කර ඇති පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම සඳහා 2010.12.31 දින දක්වා හෝ ඔවුන් කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවය සම්පූර්ණ කරන දිනය හෝ යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා සහන කාලයක් ලබා දීමට තීරණය කර ඇත.

02. ඒ අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවීම හේතුවෙන් වැටුප් වර්ධකය විලම්භනය කිරීමට සිදු වන නිලධාරීන්ට 2010.12.31 දින දක්වා වැටුප් වර්ධක ගෙවීම් කරන ලෙස දන්වමි. මෙය 2004.01.01 දින සිට 2006.12.31 දින දක්වා විවෘත හා සීමිත තරග විභාගවලින් සමත්ව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බැඳුන නිලධාරීන්ට අදාළ වේ.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 සහ 2009.02.20 දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති (1 කාණ්ඩය) හි 110 වගන්තියේ විධිවිධානවලට යටත්ව කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට දෙනු ලබන සහන කාලයට සමාන කාලයකින් පරිවාස කාලය ද දීර්ඝ කරනු ලැබේ.

04. මෙම ඒකාබද්ධ සේවා චක්‍රලේඛය ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාවය ඇතිව නිකුත් කරන ලදී.

බී.පී.පී.එස්.අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

ඒකාබද්ධ සේවා චක්‍රලේඛ : 01/2009

මගේ අංකය : පීඒ/සීඑස්/6/4/කා.ක.විභාග,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2009 මැයි මස 05 වන දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරුන්.

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II පන්තියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංශෝධන අංක 01 හි 14:3:4 ඡේදය අනුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II පන්තියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් නොවූ නිලධාරීන්ට ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයේ සිට විභාග අවස්ථා 06 ක සහන කාලයක් ලබා දෙන බව සඳහන් වේ.

02 ඒ අනුව ව්‍යවස්ථාවේ විධිවිධාන එලෙසම ක්‍රියාත්මක කර විභාග අවස්ථා 06 ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වුවහොත් ව්‍යවස්ථාවේ 5:3 වගන්තිය අනුව විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන පළමු කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවය සම්පූර්ණ කළා සේ කටයුතු කරනු ලැබේ. පළමු කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවය සම්පූර්ණ කළ දිනය පහත පරිදි තීරණය කරනු ලැබේ.

| විභාග අවස්ථාව | විභාගය පැවැත්වූ දිනය * / පවත්වනු ලබන දිනය | කාර්යක්ෂමතා කඩඉම් අ-යතාවය සම්පූර්ණ කළා සේ සලකන දිනය |
|---|---|---|
| 1 | 2007.03.31 * | 2005.01.31 |
| 2 | 2007.12.08 * | 2005.07.31 |
| 3 | 2008.10.25 * | 2006.01.31 |
| 4 | - | 2006.07.31 |
| 5 | - | 2007.01.31 |
| 6 | - | 2007.07.31 |

03. මෙම චක්‍රලේඛය බලපවත්වනුයේ 2004.01.01 දිනට සේවයේ සිටි නිලධාරීන්ට පමණි. දෙවන භාෂාව සමත්වීමේ අවශ්‍යතාවය මෙයට ඇතුළත් නොවේ. දෙවන භාෂාව සමත් වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම පිළිබඳව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංශෝධන අංක 1 හි 5:2 ඡේදයේ සඳහන් වේ.

04. මේ අනුව ව්‍යවස්ථාවේ දැක්වෙන දින වකවානු තුළ විභාග පැවැත්වීම අදාල නිලධාරීන්ගේ වගකීමක් වනු ඇත.

05. මෙම ඒකාබද්ධ සේවා චක්‍රලේඛය ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාවය ඇතිව නිකුත් කරන ලදී.

බී.පී.පී.එස්.අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු

ඒකාබද්ධ සේවා චක්‍රලේඛ : 06/2007(I)

මගේ අංකය: PA/CS/6/PMAS III/පරි.පුහුණු,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2009 පෙබරවාරි මස 24 වන දින

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරු සහ ප්‍රාදේශීය ලේකම්වරුන්,

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ 5:1 වගන්තිය යටතේ පරිගණක හැකියාව විමසන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කරන නිලධාරීන්ට පුහුණු දීමනා ප්‍රතිපූරණය කිරීම.**

මගේ ඉහත සමාංකයෙන් හා 2007 නොවැම්බර් මස 09 දාතමින් නිකුත් කරන ලද ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 06/2007 හි 03(අ) උප ඡේදය ඉවත් කරමි. ඒ වෙනුවට පහත සඳහන් උප ඡේදය ආදේශ කරමි.

02.
"03(අ) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ නිලධාරීන් පරිගණක දැනුම පිළිබඳ ලිඛිත පරීක්ෂණය සමත් වූ බවට / ව්‍යවස්ථාවේ 5:1:2 ඡේදය අනුව විභාගය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ බවට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිගමනය කරනු ලබන ලිපියක් නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරනු ඇත. ඒ අනුව නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් එම දීමනාව ගෙවිය යුතුය. එලෙස ගෙවන මුදල අදාළ දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ නියමිත වැඩසටහන සහ ව්‍යාපෘතිය යටතේ ඇති පුද්ගල පඩිනඩි වියදම් සඳහා වෙන් කර ඇති දීමනා යටතේ වැය කිරීමට කටයුතු කළ යුතු වේ."

03. එම චක්‍රලේඛයේ අනෙකුත් උප වගන්තිවල කිසිදු වෙනසක් නොවේ.

04. ඉහත ක්‍රියාමාර්ගය 2009.01.01 දින සිට ක්‍රියාත්මක කළ යුතු වේ.

05. මෙම චක්‍රලේඛය භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව නිකුත් කරන ලදී.

බී.පී.පී.එස්.අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය.

අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2007 නොවැම්බර් මස 09 වන දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ 5:1 වගන්තිය යටතේ පරිගණක හැකියාව විමසන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කරන නිලධාරීන්ට පුහුණු දීමනා ප්‍රතිපූරණය කිරීම.</u>**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවේ 5:1 හා 5:1:2 උප වගන්තිවල නියම කර ඇති පරිදි පරිගණක දැනුම පිළිබඳ ලිඛිත පරීක්ෂණය සමත්වීමට හෝ පිළිගත් සහතික ඉදිරිපත් කර විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වීමට අදාල විධිවිධාන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියේ නිලධරයන්ට නියම කර ඇත.

02. ඉහත කී අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ බවට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන්ට තම පරිගණක දැනුම වර්ධනය කර ගැනීම සඳහා දරන ලද පුහුණු වියදම් ප්‍රතිපූරණය කිරීමක් ලෙසට රුපියල් 7000/- ක දීමනාවක් ගෙවීමට රජය තීරණය කර ඇත.

03. මෙම දීමනා ගෙවීම පහත දැක්වෙන ආකාරයට සිදුකළ යුතුය.

(අ) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ නිලධාරීන් පරිගණක දැනුම පිළිබඳ ලිඛිත පරීක්ෂණය සමත් වූ බවට / ව්‍යවස්ථාවේ 5:1:2 ඡේදය අනුව විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කළ බවට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිගමනය කරනු ලබන ලිපියක් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීට පිටපතක් ඇතිව නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරනු ඇත. ඒ අනුව ප්‍රධාන ගණකාධිකාරී විසින් ප්‍රතිපාදන සලසා දුන් පසුව නිලධාරියා සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් එම දීමනා ගෙවිය යුතුය. එලෙස ගෙවන මුදල ප්‍රතිපාදන වෙන් කර දෙන වැය විස්තර යටතේ වියදම

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත මාසික ගිණුම් සාරාංශය මගින් එම වියදම දරන මාසය අවසානයේ දී වාර්තා කල යුතුය. එම වියදම දරන ලද මාසයේ දී ඒ පිළිබඳ හර නිවේදනය ප්‍රධාන ගණකාධිකාරී, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා එවිය යුතුය.

(ආ) ගෙවීම් කිරීමෙන් පසු ගෙවීම් කළ බවට සහතිකයක් නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කළ යුතු අතර තවත් පිටපතක් ප්‍රධාන ගොනුවට ඇතුලත් කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්‍ෂ ජනරාල් වෙත එවිය යුතුය.

(ඇ) මෙම ගෙවීම් ක්‍රමය වලංගු වනුයේ නිලධාරියාගේ පත්වීම් දිනයේ සිට පරිගණක දැනුම පිළිබඳ ලිඛිත විභාග පැවැත්වූ වාර 06 දක්වා පමණක් වන හෙයින් නිලධාරියා ගෙවීම් ලැබීමට හිමිකම් ලබන බවට තිකුත් කරන සහතිකයේ ඒ දක්වා පවත්වන ලද විභාග වාර ගණන සඳහන් විය යුතුය.

(ඈ) 2004.01.01 දින හෝ ඊට පසු දිනක සිට බල පවත්වන ලද පත්වීම්ලාභීන් සඳහා පමණක් මෙම දීමනා හිමි වේ.

(ඉ) ගෙවීම් අනුමත කළ නිලධාරීන්ගේ ලේඛණයක් අදල බලධරයා විසින් පවත්වා ගෙන යායුතු වේ.

04. මෙම දීමනා ගෙවනු ලබන්නේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 10 වන වගන්තිය අනුව ආරම්භක පුහුණු අවස්ථා සැලසීමේ විකල්පයක් වශයෙන් වන හෙයින් නිලධාරීන් තමන් කැමති ඕනෑම පෞද්ගලික හෝ රාජ්‍ය අනුබද්ධ ආයතනයකින් මුදල් ගෙවා පුහුණුව ලබා ගෙන ව්‍යවස්ථා සංග්‍රහයේ 5:1 හෝ 5:1:2 ඡේදය යටතේ දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

ඒ.තෝබට්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

ඒකාබද්ධ සේවා චක්‍රලේඛ. 01/2005

මගේ අංකය :- PA/CS/MAS
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
2005.02.25

සියලුම අමාත්‍යාංශ ලේකම් වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසාපති/දිස්ත්‍රික් ලේකම් වරුන්/ප්‍රාදේශිය ලේකම් වරුන්,
සහ රාජ්‍ය ආයතන ප්‍රධානීන් වෙත.

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය ක්‍රියාත්මක වීම

යථෝක්ත කාරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක: 10/2004 සහ 2004.12.30 දනම දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02 අංක 1372/23 - 2004.12.24 දතම දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සහ උක්ත චක්‍රලේඛය අනුව පහත දක්වෙන සේවාවන් හා එම සේවාවන් වලට අදල ව්‍යවස්ථා සංග්‍රහයන් 2005.03.23 දිනෙන් පසුව මූළමනින්ම අහෝසි වේ.

1. සාමාන්‍ය ලිපිකාර සේවය
2. රජයේ යතුරුලේඛක සේවය
3. රජයේ ලඝුලේඛක සේවය
4. රජයේ පොත් තබන්නා සේවය
5. රජයේ සරප් සේවය සහ
6. රජයේ ගබඩා භාරකාර සේවය

03 මේ අනුව ව්‍යවස්ථා සංග්‍රහයේ 14:1 ඡේදය සහ xiii වන පරිශිෂ්ඨය ප්‍රකාරව 2005.03.23 වන දින හෝ ඊට පෙර විධිමත් ලෙස රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාප ප්‍රකාශ පත්‍රයක් ඉදිරිපත් කර ඇති නිලධරයන් හැර අනෙකුත් සියලුම නිලධරයන්ගේ සේවය 2005.03.23 දිනෙන් පසු අහෝසි වේ. තව ද මනාපය පළ කිරීමේ අවසන් දිනයට පෙර කටයුතු කල හැකි වන පරිදි රාජ්‍ය පරිපාලන අංක 10/2004 චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව සියළුම නිලධරයන් දැනුවත් කිරීමට අදල බලධරයන් වගබලා ගත යුතුය.

04. එක් නිලධාරියකුට ඉදිරිපත් කළහැක්කේ එක් මනාප ප්‍රකාශ පත්‍රයක් පමණි. දෙපාර්තමේන්තු ප්‍රධානියකු මගින් මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කල මනාප ප්‍රකාශ පත්‍රයක් ඉල්ලා අස්කරගෙන ඒ වෙනුවට වෙනත් මනාප ප්‍රකාශ පත්‍රයක් ඉදිරිපත් කිරීමට කිසිවෙකුට ඉඩ දෙනු නොලැබේ. දැනටමත් ඒ අනුව එකම පුද්ගලයෙකුට දෙවන මනාප ප්‍රකාශ පත්‍රයක් ඉදිරිපත් කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත්නම් පළමුව ඉදිරිපත් කල මනාප ප්‍රකාශයේ මනාපය ක්‍රියාත්මක වන බවට සැහීමකට පත් විය යුතු අතර, දෙවනුව ඉදිරිපත් කළ මනාප ප්‍රකාශ පත්‍රය පිළිබඳව මා දැනුවත් කර මා වෙතින් ඉවත් කර ගත යුතු වේ.

05.(අ). ඉහත චක්‍රලේඛය යටතේ විශ්‍රාම ගැන්වීමට මනාපය පළ කල නිලධාරීන්ට 2005.03.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරු නියෝග දී ඇත්නම් ඒවා අවලංගු කලා සේ සැලකිය යුතුය. විශ්‍රාම ගැන්වීමට මනාපය පළ කල නිලධාරීන්ට විශ්‍රාම ගැන්වීම අනුමත කල ලිපියක් නිකුත් කරන අතර ඔවුන්ට 2005.03.23 දින තෙක් මනාප ප්‍රකාශ පත්‍රය ඉදිරිපත් කල කාර්යාලයේ සේවය කිරීමට ඉඩ ලැබෙන අතර එම කාර්යාලයෙන්ම විශ්‍රාම ගැන්විය යුතුය.

05.(ආ). කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කළ නිලධරයන් සම්බන්ධයෙන් නිකුත් කර ඇති ස්ථාන මාරු නියෝග එපරිද්දෙන්ම ක්‍රියාත්මක විය යුතුය.

06 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට පත්වන නිලධාරීන්ට ඔවුන් මෙතෙක් කර ගෙන ආ කාර්යයන් හා විෂයයන්ට අමතරව වෙනත් කාර්යයන් හා වැඩ විෂයයන් පිළිබඳව කාර්ය ස්ථාන පුහුණුවක් ලබා දීමට කටයුතු කළ යුතු වේ. ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා විෂය ප්‍රවීනයන්ගේ සහාය ඇතිවද, නිලධාරීන් කණ්ඩායම් ලෙස විවිධ විෂය කටයුතු වල යෙදීමට ඉඩ සැලසීමෙන්ද ඒ සඳහා පහසුකම් සලසා ගත හැක. ඉදිරියේදී නිලධාරීන්ට තමන් ප්‍රිය මනාප කරණ/පහසු සේවා ස්ථානයකට හෝ විෂයකට මාරුවීම වැනි අවස්ථාවලදී එය ප්‍රමුඛත්වය ලැබීමට හේතු වනු ඇත. නිලධාරීන් විවිධ විෂය/කාර්යයන් පුහුණුවේදී ඔවුන්ගේ සහජ හැකියාවන් හා නිර්මාණශීලී ක්‍රියාකාරකම් තුලින් සේවය තුල ඉහලම ස්වයං වටිනාකමක් හිමිකරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

07 2005.03.01 වන දින සිට 2005.03.31 දින දක්වා ස්ථාන මාරුවීම් සම්බන්ධ නියෝග නිකුත් කිරීම අත්හිටවනු ලැබේ. 2005.04.01 වන දින සිට ස්ථාන මාරුවීම් පිළිබඳව කටයුතු කිරීමේදී (ආයතන සංග්‍රහයේ iii පරිච්ඡේදයේ දැක්වෙන වාර්ෂික මාරුවීම් නොවන අවස්ථාවලදී) පහත දැක්වෙන පියවර අනුගමනය කළ යුතුය.

(අ) සෑම ඉල්ලුම් පත්‍රයක්ම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය, අත්සන සහ නිලමුද්‍රාව ඇතිව ඉදිරිපත් කිරීම.(නිර්දේශ කිරීමේදී අනුප්‍රාප්තිකයකු සහිතව / රහිතව නිදහස් කල හැකිදැයි දැක්විය යුතුය)

(ආ) කිසියම් සේවා ස්ථානයකට ස්ථාන මාරුවීමක් ඉල්ලා සිටින නිලධරයකු එහි පවත්නා පුරප්පාඩුවට අදාල විෂයය / කාර්යන් ඉටු කිරීමට එකඟතාවය පළ කළ යුතුය.

(ඇ) කිසියම් සේවා ස්ථානයක පුරප්පාඩු පවතින බව වාර්තා කරන විට එහි පවත්නා පුරප්පාඩු වල පවතින විෂයය / කාර්යයන් මොනවාද යන්න සටහන් කිරීම

(ඇ) සුහද ස්ථාන මාරුවීම් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී ද පවරන විෂයය / කාර්යයන් ඉටු කිරීමේ එකඟතාවයට යටත්ව දෙපාර්තමේන්තු ප්‍රධානයන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

08 2004.03.24 වන දිනට එක් එක් දෙපාර්තමේන්තුවේ යටත් නිලධාරීන් සම්බන්ධයෙන් මේ සමඟ එවන "ඇ" ආකෘතියට අදල වාර්තාවක් සකස් කර එම වාර්තාව 2005.04.10 දිනට පෙර ලැබෙන සේ මා වෙත එවන්න. රජයේ ඒකාබද්ධ අරමුදලෙන් වැටුප් ලබන නිලධාරීන් සම්බන්ධයෙන් පමණක් තොරතුරු එහි ඇතුලත් විය යුතු වේ.

**ජයම්පති පී.හෙට්ටිආරච්චි**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
2. ආයතන අධ්‍යක්ෂ ජනරාල්
3. විගණකාධිපති
4. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ

} තනතුරු නාම සහ සේවාවන් වෙනස්වීම පිළිබඳව දැනගැනීම සඳහා

## යටත් නිලධාරී ශ්‍රේණිය

"ඇ" ආකෘතිය

දෙපාර්තමේන්තුව:

වැටුප් ගෙවන වැය ශිර්ෂය:

අනුමත කාර්යය මණ්ඩලය.

| | | අධිපන්තිය | I පන්තිය | II පන්තිය | III පන්තිය |
|---|---|---|---|---|---|
| 1 | 2005.03.23 වන දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල කල සංඛ්‍යාව | | | | |
| 2 | විශ්‍රාම යාමට මනාපය පල කල සංඛ්‍යාව | | | | |
| 3 | මනාප ප්‍රකාශ පත් ඉදිරිපත් නොකල සංඛ්‍යාව | | | | |
| 4 | පුරප්පාඩු සංඛ්‍යාව | | | | |
| 5 | ලිපිකරු සහ සමාන්තර සේවා වලට අයත් වැටුප් ගෙවන වෙනත් නිලධාරීන් සිටිනම්<br>(පලාත් සභා නිලධාරීන් හෝ වෙනත්) | | | | |
| | එකතුව | | | | |

දිනය:

අත්සන:

නම:

නිල නාමය:

නිල මුද්‍රාව: